# බුද්ධඝෝෂ හිමි - බ්‍රාහ්මණයන්ගේ 'ඒජන්ත' වරයෙක් ද?

**බ්‍රාහ්මණයන් කිසිවිටෙකත් තම අභිමතාර්ථය වෙනුවෙන් ක්‍රියා කිරීම නතර කළේ නැත.** වේදයට සියුම් වෙනස්කම් හඳුන්වා දී, **හින්දු ආගම බ්‍රාහ්මණ ආගමට පරිවර්තනය කර, තමන් ‘අතරමැදිකරුවන්’ ලෙස පත්කරගෙන, අද දක්වාම සමාජ දේහය විනාශ කරන කුල ක්‍රමයක් නිර්මාණය කළහ.**

මෙම කූට උපක්‍රම අතරේ ඔවුන් බුදුදහමට එරෙහි නොවී කලේ ඉතා කපටි ලෙස **බුදුන් වහන්සේව ඇතුළත් කරගත්තේය**: ඔහුව **විෂ්ණුගේ නවවන අවතාරය කරවීමෙන්!** හොඳයි, ඔවුන් එතැනින් නොනැවතුණු අතර, මගේ මතය අනුව, බුදුන් වහන්සේගේ නිර්මල ඉගැන්වීම් බ්‍රාහ්මණයන්ගේ අනසකට යටත් කර ගැනීමට උත්සාහ කළ අතර, ලක්දිව බුදුදහම වේගයෙන් ලංකාව පුරා පැතිරෙන්නට විය. මෙන්න මේ හේතුව නිසා ඔවුනගේ ඊලග කූට ඉලක්කය ලංකාව දෙසට ක්‍රියාත්මක වීමේ ක්‍රියාන්විතය පහත ආකාරයට සිදු විය.

**5වන සියවසේ භාරතීය** ථෙරවාදී බෞද්ධ විද්වතා වූ **බුද්ධඝෝෂ** ථෙරවාදයේ වැදගත්ම විචාරකයා ලෙස සමහරු සලකන නමුත් බොහෝ දෙනෙක් ඔහුව සලකන්නේ **බ්‍රාහ්මණයන්ගේ 'ඒජන්ත'** ලෙසය. https://www.dhammikaweb.com/?p=23072

සිංහල බසින් ලියැවුණු අටුවා පොත් විශාල ප්‍රමාණයක් සංස්ලේෂණය කර පාලි ග්‍රන්ථයට පරිවර්තනය කිරීමේ වගකීම බුද්ධඝෝෂ හිමි කර ඇති බව පැවසේ. **මේ සිංහල අටුවා පරිවර්තනයෙන් පසු ගිනිබත් විය**. එය **බුද්ධඝෝෂ විසින්ම කරන ලද්දක්** බවට විශ්වාසයක් පවතී. (අපගේ අදහස නම් බුද්ධඝෝෂ බ්‍රාහ්මනයින් සමග එකතුව බුදුදහම **බ්‍රාහ්මණ ආගමට පරිවර්තනය කර, තමන් ‘අතරමැදිකරුවන්’ ලෙස** පත්කරගැනීමේ සියළු වැඩපිළිවෙල සකස් කරගෙනයි ලංකාදීපයට ගොඩ බැස්සේ. ඒ බව බුද්ධඝෝෂ මෙරටට ගොඩ බැස්ස විගස ඔහුට හොඳ පසුබිමක් සකස් වී තිබුනා. බොහෝ දුරට ඉංදියාවේ සිටම මහා විහාරවාසී ස්වාමීන් වහන්සේලා හමුවෙන්න වැඩපිළිවෙල සාදාගෙනම පැමිණෙන්න ඇත. එම නිසා මහා විහාරවාසී ස්වාමීන් වහන්සේලා මේ බුද්ධඝෝෂ හිමිව පිළිගත්තා පමණක් නොව ඔහු මෙරට පැමිණි ක්‍රියාන්විතයට සියලු පහසුකම් සැලසුවා. මේ වනවිට ලංකාවේ තිබුනේ මහානාම රාජ්‍ය සමය( ක්‍රි ව 409-431) - මෙම මහානාම රාජ්‍ය සමය තමයි **ලංකා මහාවිහාර වාසී භික්ෂූන්** මහාසේන රජුගේ සමයේ (ක්‍රි.ව 334-362) එල්ල වූ වූ දරුණු ප්‍රාහාරවලින් බැට කා, **අභයගිරිය වාසී භික්ෂූන්ගේ සමෘද්ධිමත් කාලය දැක දැක සිටි කාලය.**

අභයගිරිය වාසීන් හමුවේ, ඔවුනගේ සමෘදිමත් කාලය දැක දැක සිටි කාලය. **මෙන්න මේ කාලයේ තමා බුද්ධඝෝෂ හිමි ගොඩ බහින්නේ. දැන් අපට සිතා ගන්නට හැකියි බ්‍රාහ්මනයින් ප්‍රමුඛ බුද්ධඝෝෂ හිමිගේ සූක්ෂම සැලැස්ම ලංකා බිමේ ඉතාමත් අපූරුවට ක්‍රියාත්මක කිරීමේ බිම සැකසී තිබූ බව. බුද්ධඝෝෂ හිමිගේ පැමිණීම හේතු වන්නට ඇති** අභයගිරි වාසී භික්ෂූණ් වහන්සේලා අභිබවා යන්නට, නැවත වරක් මහාවිහාරවාසී භික්ෂූන්ට තම නැතිවී තුබූ ලංකා භූමියේ රජවරුන් පවා බියවද්දගෙන සිටි බලය ගන්නට සූක්ෂම ක්‍රමය මේ බ්‍රහ්මයන් ප්‍රමුඛ බුද්ධඝෝෂ හිමි මහවිහාර වාසි භික්ෂූනට පවසන්නට ඇති. නැත්නම් මෙවන් විපතක් එනම් පුදපූජා වලින්, යාථිකා හරහා බුදුදහම දේවාගමක් තත්වයට පරිවර්ථනය වන බව මහාවිහාරවාසී භික්ෂූන් නො දැන සිටියා කියන එක සැක සහිත කරුණකි. මේ බව තහවුරු වෙනවා අදටත් බහුතරයක් භික්ෂූණ් වහන්සේලා බුද්ධඝෝෂ හිමිට බුදුවරයෙක්ට සේ සැලකීම සහ ගෞරව කිරීම මොකද ඔහු පසුපසයි ලාභසත්කාර , මිල මුදල් රැදී තිබෙන්නේ. එම නිසයි එක්තරා උගත් මහාචාර්ය වරයෙක් එක දේශනයක පැවසූවේ අද ලංකාවේ තිබෙන්නේ බුදුදහම නොව බුද්ධඝෝෂ දහම කියලා.

සිත්ගන්නා කරුණ නම්, ථෙරවාදය සම්මිශ්‍රණය(බුදුදහම හින්දු ආගමේ/වේදයේ එන ආකාරයටම දේවාගමක් කර, පුදපූජා, යාතිකා, සජ්ජායන, ගස්ගල් පිළිම වන්දනා කිරීමේ ක්‍රමය, පිංදීම සහ පිංඅනුමෝදම් කිරීම හරහා නිවන ප්‍රාර්ථනා කල හැකි බවත්, නිවන දක්වා යන බුදුන්ගේ ප්‍රායෝගික වැඩපිලිවලට පිංකම් වන්දනා හරහා පහසුවෙන් යා හැකි මිත්‍යාවෙන් පිරුණ පාරක් සෑදීම) කර **ඔහුගේ අරමුණ ඉතා සාර්ථකව ඉටුකරගෙන. පරිවර්තන සම්පූර්ණ කිරීමෙන් පසු, බුද්ධඝෝෂ නැවත ඉන්දියාවට ගිය අතර, නැවත කිසි දිනෙක අසන්නට නොලැබේ.**

බ්‍රාහ්මනයන් විසින් බුද්ධඝෝෂට දුන් රාජකාරිය වූ "බුදුදහම දේවාගමක් කර ,හින්දු ආගමට සම්මිශ්‍රනය කිරීමේ වගකීම ඉතා හොදින් සූක්ශමව කිරීමට බුද්ධඝෝෂ සමත් වූවා.

මේ ඔහු කල සූක්ෂම ව්‍යාපෘති කීපයක්

1. **බුද්ධඝෝෂ දක්වනවා මේ ආනන්ද බෝධිය රෝපනය කලේ බුදුරජාණන් වහන්සේ වැඩසිටි සමයේ කියා.** - බුද්ධ පූජා සහ බුද්ධ වන්දනා සදහා ද බුදුන්ගේ අනුමැතිය ලැබූ බවද එම වන්දනා සහ පූජා චාරිත්‍රයන් බුද්ධ කාලයේ සිටම බෞද්ධ ව්‍යවහාරයේ පැවති බවද සනාථ කිරීම සදහා බුද්ධඝෝෂ විසින් කාලිංග බෝධි ජාතකයට ලියූ අට්ඨ කථාව අතරමග ආනන්ද බෝධියක් පිළිබඳ කථාවක් යොදා ගැනීම ද ගැටලු සහගතය. බුද්ධඝෝෂගේ අට්ඨකථාවේ කාලය වන ක්‍රිස්තු වර්ෂ පස්වන(5) සියවසේ සිදුවීමක් බුද්ධ කාලයේ සිදුවීමක් වශයෙන් මවාපෑම ගැටලු සහගතය. http://www.dhammikaweb.com/?p=22803

2. **බුදුවදනට පටහැනි, බුද්ධඝෝෂගේ කර්ම විග්‍රහය:-** බුද්ධඝෝෂ කම්ම සරික්ඛතා සංකල්පය නොහොත් සමාන කර්මයන්ට සමාන විපාක:- බුද්ධඝෝෂ හිමි, කර්මය ගැන කරන විස්තරයේදී බුදුන්ගේ කර්ම දර්ශනය නියති වාදයක් බවට පත් කිරීමට සමත් වී ඇති බව ද පෙනේ. බුදුන් වහන්සේ විසින්ද,මිනිසාට අතීත කර්ම සම්භාරයක් අයත් විය හැකි බව පිළිගත් නමුත් කිසිම ආකාරයකින් මිනිසා එම අතීත කර්මයන් ක්‍රියාත්මක වනතුරු බලා සිටිය යුතු අසරණයන් වශයෙන් නො සැලකූ බව අවධාරනය කළ යුතු ය. අංගුලිමාල නම් දාමරිකයා සියලු අතීත කර්ම මෙන්ම අනාගතයෙහි විපාක දිය හැකි කර්ම සම්භාරයන්ද අක්‍රිය කිරීමෙන් බුද්ධ මතය තහවුරු කළ ආකාරය මීට නිදසුනකී. මේ අකාරයෙන් පාළි පිටක ග්‍රන්ථයන්හි පැහැදිලිව දැක්වෙන තථාගත දර්ශනයට පිටුපාන,නියතවාදී අදහස් බුදුන්ගේ අනුමැතිය ලත් අදහස් වශයෙන් ම ඉදිරිපත් කිරීමට අටුවාකරුට ඉඩ සැලසීමෙන් අවුල් සහගත තත්වය තවත් ත්‍රීව්‍ර වී තිබේ. http://www.dhammikaweb.com/?p=22827

3. මාගේ පර්යේෂණයට අනුව සහ එකතුකරගත් දත්තයන්ට අනුව බුදුරජාණන් වහන්සේ වදාළේ නැති, මේ පිංදීම සහ පිං අනුමෝදම් කිරීම හරහා තමයි බ්‍රාහ්මනයන් ප්‍රමුඛව බුද්ධඝෝෂ මේ බුදුදහම යාතිකා වලින් පිරිණු දේවාගමක් කිරීමේ පලමු සූක්ෂම සැලැස්ම දියත් කලේ.බුදුරජාණන් වහන්සේ පින් අනුමෝදන් වීමක් ගැන වදාළේ නො මැත. බුද්ධඝෝෂ කලේ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ පුණ්‍යක්‍රියා තුනට(දාන, සීල,භාවනා) බුද්ධඝෝෂ තව හතක් එකතු කර ඒ තුලට හින්දු ආගමේ එන පින්දීම සහ පින් අනුමෝදන් වීම ඇතුල් කරීම. පාළි පිටක ග්‍රන්ථවල දී බුද්ධඝෝෂ විසින් එම සූත්‍රවලට තමන්ට අවශ්‍ය කරුණු බුදුන්ගේ ම නමින් එකතු කිරීම් මගින් තථාගත දර්ශනයට අයත් නොවන දෑ අඩංගු වී ඇති ආකාරය පෙනේ. මෙවැනි එක අවස්ථාවක් වශයෙන් අංගුත්තර නිකාය, ඇට්ඨක නිපාත, දාන වග්ග පුඤ්ඤකිරිය වත්ථු සූත්‍රය(අංගුත්තර නිකාය, අට්ඨක නිපාතය. http://www.dhammikaweb.com/?p=22779.

4. **පිළිවෙත් පිරීම වෙනුවට ඇදහීම** http://www.dhammikaweb.com/?p=22728

5. සියලු පුදපූජා ඉදිරියට ගෙන බ්‍රාහ්මනයන් නියෝජනය කල බුද්ධඝෝෂ හැදුවේ පුදපූජා මාර්ගයෙන් ප්‍රාර්ථනා කරල නිවන ලබාගන්න පුලුවන් බව හගවලා බුදුරජාණන් වහන්සේ වදාළ ප්‍රායෝගික දහමෙන් මිනිසුන්ව ඈත්කර ප්‍රාර්ථනාවල් පෙරදැරි කරගත් යදින්නන් බවට පත්කිරීමයි ඒ තුලින් හින්දු/වේදයන් සේ යදින්න. ඒ සියල්ල පසුපස ලාභසත්කාර මිල මුදල් කූට ලෙස උපයනවා. අපේ බහුතරයක් හිමිවරුන් හොදටම දන්නවා බුද්ධඝෝෂ කලේ පිරිසිදු බුදුදහම පාගා දැම කියා. නමුත් බුදුන් සරණ යෑම වෙනුවට බුද්ධඝෝෂ සරණ ගියේ ඒකෙන් මුන්දැලට ලාභසත්කාර, සල්ලි එන නිසයි. මුදල් ගැරීම පේනවානේ අද බහුතරයක් පංසල් වලින් කරන කයීන

පිංකම්, බෝධිපූජා, මල්පූජා, චෛත්‍යවලට රෙදි ඇන්දවීම්, ආදී මිත්‍යාදෘෂ්ටික බුද්ධඝෝෂ පෙන්වා දුන්නටත් වඩා වැඩි දියුණු කරමින් යන පූජා දෙස බැලූ විට. ඒ අනුව අද ලංකාවේ බහුතරයක් ඉන්නේ බුද්ධඝෝෂගෙන් පැවත එන නව බුද්ධඝෝෂයන් පිරිසක් බව කිවයුතුම ය.

6. ඔවුන් ඒකයි කියන්නේ පූජා කරන්න, දෙයියන්ට පිං දෙන්න, දෙයියන්ගෙන් ආරක්ෂාව ඉල්ලන්න, චෛති වන්දනා කරන්න, ආහාර මල් පූජා කරන්න ගාථා හැදුවේ. ඒවා කියමින් මිනිසුන් අන්දයන් සේ පූජා පවත්වමින්, යදිමින් නිවනේ නාමයෙන් සැපසම්පත් පිරි භවය ප්‍රාර්ථනා කරනවා. අපේ රාහුල ස්වාමින් වහන්සේ මෙසේ එදා ප්‍රකාශ කලා "**ආර්ය අෂ්ටාංගික මාර්ගය බුද්ධාගමේ නිවන් මගයි**". එය සම්පූර්ණ මාර්ගයයි. එහි කිසිත් අඩුවක් නැත. ප්‍රාර්ථනා නො කරන්නාට නිවන් ලැබිය නො හැකි නම්, **ප්‍රාර්ථනාව නිවන් මගෙහි ඉතාම අවශ්‍ය ප්‍රමුඛ අංගයක් විය යුතුයි. එසේ නම් එය සම්‍යක් ප්‍රාර්ථනා හෝ වෙන නමකින් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහිදී බුදුරජාණන් වහන්සේ විසින් එක අංගයක් හැටියට දේශනා කළ යුතුයි**. නමුත් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ප්‍රාර්ථනාව ගැන් කිසිත් සඳහන්වී නැත.ප්‍රාර්ථනා නො කරන්නාට නිවන් ලැබිය නො හැකැයි උගන්වන්නෝ අබෞද්ධ මතයක් උගන්වති.

උවමනා කරන්නේ ප්‍රාර්ථනාව නොව, ධර්මමාර්ගයෙහි ගමන් කිරීමයි.

ප්‍රාර්ථනාව නම් යාඥාවේම විකෘතියකි. https://www.dhammikaweb.com/?p=22341

7. **මේ බුදුන් වහන්සේගේ ධර්මයද?** බුද්ධඝෝෂයන් කියන ආකාරයට බුදුන් ජීවමානව වැඩ සිටි කාලය තුළ වජ්ජි ජනපදය එබඳු දුර්භික්ෂයකට ගොදුරු වූ බවට කිසිම සාධකයක් තත්කාලීන වාර්තාවලින් නොලැබෙයි. බුදු හිමියන්ගේ පන්සාළිස් වසරක ධර්ම ප්‍රචාරක කාලය තුළ උන්වහන්සේ හෝ භික්ෂු සංඝයා හෝ ගිහි සමාජයේ පැවති පිරිත් සජ්ඣායන ශාන්ති කර්මයකට සහභාගි වූ බව දැක්වෙන අවස්ථා කිසිවක් සඳහන් නොවීම මේ සම්බන්ධ ව ලබාගත හැකි ප්‍රබල සාධකයකි. මිහිඳු හිමියන් ප්‍රධාන ධර්මදූත පිරිස විසින් මෙරටට හඳුන්වා දෙන ලද බුදුදහමට පදනම් වූයේ තුන්වන ධර්ම සංගායනාවේ දී අනුමත කරන ලද පාලි පිටක ග්‍රන්ථයන් පරිහරණය කළ දේශීය උගතුන්ට එම ග්‍රන්ථවල පැවති දුරවබෝධ තැන් පැහැදිලි කිරීම සඳහා මිහිඳු හිමියන් විසින් එකල ව්‍යවහාරයේ පැවති **දේශීය භාෂාව ලෙස සැලකෙන හෙළ බසින් ලියන ලද අට්ඨකතා පෙළක් ද වූ බවත් ඒවා පච්චරි, මහා පච්චරි, කුරුන්දි ආදී නම්වලින් හැඳින්වූ බවත්** ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් සනාථ වේ. මෙම හෙළ අටුවා මිහිඳු හිමියන්ගේ කාලයේ සිට ක්‍රි.ව. පස්වන සියවස තෙක් වූ සියවස් අටක හෙවත් අවුරුදු අටසියයකට ආසන්න කාලයක් දේශීය උගතුන්ගේ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් වූ බව ද පෙනෙයි. එදා එම කාර්යය සඳහා ඒවා ප්‍රමාණවත් නොවූ බවට ඉඟියක් හෝ පළ නොවේ. හෙළ අට්ඨකතාවලින් සමන්විත මුල් පිටක ග්‍රන්ථ හැදෑරීමෙන් සහ විමුක්ති මඟ පිළිපැදීමෙන් මේ රටේ රහතුන් බිහි වූ යුගය පාලි

අට්ඨකතා යුගයේ ආරම්භයත් සමඟ අවසන් වූ බව පැහැදිලිව පෙනී යයි. මෙතරම් දීර්ඝ කාලයක් මුළුල්ලේ මෙරට උගතුන්ගේ පරිහරණයේ හෙළ **අටුවා පාලි භාෂාවට නැඟීමේ කාර්යය හෙළ භාෂා ප්‍රවීණත්වය ද නොසලකා හරිමින් පිටස්තරයෙකුට බාර දීම නොපැහැදිලි කරුණකි.** බුද්ධඝෝෂයන්ගේ බුදුදහම පිළිබඳ දැනීම විසුද්ධි මාර්ගය ලිවීමෙන් පමණක් මැන බැලූ මහාවිහාරිකයන් ඔහුගේ ග්‍රන්ථකරණය සඳහා හෙළ අටුවා අවශ්‍ය නොවූ බව සිතීම සාධාරණ බව පෙනේ. වෙනත් වචනවලින් කිවහොත් හෙළ භාෂා ප්‍රවීණත්වය ලැබීමේ අවශ්‍යතාව බුද්ධඝෝෂයන්ට අත්‍යවශ්‍ය සුදුසුකමක් වශයෙන් සලකන ලද බවට සාක්ෂි සොයා සපයා ගත හැකි නොවන්නේ හෙළ බසින් ලියූ අට්ඨකතා ඔහුගේ කාර්ය සඳහා එතරම් අදාළ නොවීම නිසා ද විය හැකි ය. කෙසේ වුව ද බුද්ධඝෝෂයන් විසින් පාලි අට්ඨකතා සමස්තයක් වශයෙන් ගෙන විමසා බැලීමේ දී කිහිප අවස්ථාවක දීම **'බුද්ධ' යන වචනය මෙම 'බෞද්ධ විමුක්ති මාර්ගය' ද වෙනස් කර ඇති බැව් පෙනී යයි. එවැනි වෙනස් කිරීම අටුවාකතාකරුවෙකුට ගැළපෙන ක්‍රියා මාර්ගයක් වන්නේ ද යන්න විමසා බැලීම සුදුසු ය.** https://www.dhammikaweb.com/?p=22815

8. **විශුද්ධි මාරගයේ දැක්වෙන** දැනට සම්මත, පටිච්චසමුප්පාද ධර්ම විවරනයට අනුව, අංග දොලහෙන් අවිජ්ජා, සංඛාර දෙක අතීතයට අයත් හැටියටත්, ජාති,ජරා,මරණ කියන අංග දෙක අනාගතයට අයිති හැටියටත්, ඊලගට විඥ්ඤාණ, නාමරූප, සලායතන,පස්ස,වේදනා,තන්හා,උපාදාන, භව කියන අංග අට(8) වර්තමානයට අයිති හැටියට ත් දැක්වෙන වා. ඉතින් ඒ විවරණය, ඒ මතය අපි පිළිගතහොත්, අර හෙමක මානවකයා අනෙක් ආගම් දර්ශනය ගැන කියාපු මෙසේ විය, මෙසේ වන්නේ ය කියපු චෝදනාව අපේ ධර්මයටත් එල්ල වෙන වා. නමුත් මේ ධර්මය මෙසේ මෙසේ ධර්මයක්ව ත්, එසේ මෙසේ ධර්මයක්ව ත් නොවේ.මේ කියාපු භව තුනේ විග්‍රහය ඔප්පු කරන්න, විශුද්ධි මාර්ගයේ කතෘ – බුද්ධගෝස හිමි විසි අකාරයේ පටිච්චසමුප්පාද විස්තරයක් ඉදිරිපත් කරන වා. පහේ ගොඩවල්...මෙන්න මේ විශුද්ධි මාර්ගයේ විග්‍රහය තුලින් පටිච්චසමුප්පාද අංග දොලහ අතර තියෙන ඉදප්පච්චතා කියන ඒ පුදුම සම්බන්දතාව පලුදු වෙන වා. https://www.dhammikaweb.com/?p=20528

**බුදුදහම සහ බුද්ධගෝෂ දහම:-**

**අපට මතකයි එක්තරා දේශනයක් අවසානයේ අපේ උගත් මහාචාර්යවරයෙක් ඉතාමත් වේදනාවෙන් ප්‍රකාශ කළා "අද ලංකාවේ මුල්බැසගෙන තිබෙන්නේ බුදුදහම නොවේ බුද්ධගෝෂ දහම" කියලා. එය මොනතරම් නිවැරදි ද කියා අපට සිතුනා...... බුද්ධගෝස අටුවාචාරීන් වහන්සේ** සංයුත්තනිකායේ ජටා සූත්‍රයට අටුවාව දෙන්නේ මෙහෙමයි. "අන්තො ජටා බහි ජටා, ජටාය ජටිතා පජා; තං තං ගොතම පුච්ඡාමි, කො ඉමං විජටයෙ ජට''න්ති. "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො, චිත්තං පඤ්ඤඤ්ච

භාවයං; ආතාපී නිපකො භික්ඛු, සො ඉමං විජටයෙ ජටං. උන්වහන්සේ කියන්නේ ජටාව කියන්නේ තන්හාව, **" අන්තො ජටාව" කියන්නේ තමන්ගේ පරිශ්කාර වලට තියෙන තන්හාව, "බහි ජටාව" කියන්නේ අනුන්ගේ පරිශ්කාර වලට තියෙන තන්හාව කියා.** තවත් විදිහකට තෝරනවා තමන්ගේ ආත්මභාවය මේ ශරීරය, මේ ශරීරයට තියෙන ඇල්ම තමා අන්තො ජටා ව, අනුන්ගේ ශරීර වලට තියෙන ඇල්ම, අනුන්ගේ ආත්මභාව වලට තියෙන ඇල්ම තමයි බහි ජටා ව. ( බලන්න කොපමන දුර්වල විග්‍රහයක් ද කියා මේක) . තවත් තේරුමක් දෙනවා, ආධ්‍යාත්මික ආයතන හය එනම් ඇස,කන,නාසය,දිව,කය,මන කියන හයේ අන්තො ජටා ව, බහි ජටා ව යනු ඒවාට තියෙන අරමුණු, රූප,ශබ්ධ,සන්ධ,රස,කොට්ඨබ්බ,ධම්ම ඔන්න ජටා ව තෝරන හැටි බුධගෝස හාමුදුරුවෝ. ඉන් පස්සේ නාමය තෝරන්නේ වේදනා, සංඥා,සංස්කාර,විඥාණ කියන හතර ස්කන්ධය කියා. නාමය කියන්නේ කිසි සේත් එතනට විඥාණය අයිති නැහැ. නාමයට කිසිසේත් විඥාණය අයත් වන්නේ නැහැ, නාමය කියන්නේ වේදනා, සංඥා, චේතනා, පස්ස,මනසිකාර කියන ධර්ම පහ බව. නාමයට විඥාණය අයත් වන්නේ නැති බව පෙන්වීමට තවත් සූත්‍ර දේශනාවක් තමයි. මජ්ඣෙසුත්තං **– අඞ්ගුත්තරනිකාය, ඡක්කනිපාතපාළි, 6. මහාවග්ගො – "නාමං ඛො, ආවුසො, එකො අන්තො, රූපං දුතියො අන්තො, විඤ්ඤාණං මජ්ඣෙ, තණ්හා සිබ්බිනී; තණ්හා හි නං සිබ්බති තස්ස තස්සෙව භවස්ස අභිනිබ්බත්තියා. (නාමය එක් අන්තයක, රූපය දෙවෙනි අන්තයයි. විඤ්ඤානය මධ්‍යයයි, සිබ්බනි නම් තෘෂ්ණාව ඒ ඒ භවයේ ඉපදීම තෘෂ්ණාවෙන් ඔහු වසයි. ) මෙම සූත්‍රයේ ද නාමයට පිටින් විඤ්ඤානය තිබෙන බව පැහැදිළි වේ.**

බලන්න අටුවා සම්ප්‍රදාය තුල කවුරුත් කියන්නේ, නාමය කියලා කියන්නේ අර ස්කන්ධ හතර කියා. එය එහෙම පිටිම්ම වැරදියි. විඥාණය කිසිසේත් නාමයට ඇතුල් කරන්න බැහැ.

ඔන්න ඊලගට "පටිසං රූප සංඥා" කියන එක තෝරන්නේ අටුවාචාරීන් වහන්සේ මෙහෙමයි.... https://www.dhammikaweb.com/?p=21556

**9. මූලපරියාය සූත්‍රය ට බුදුගොස් හිමියන් දී තිබෙන අටුවාව -බොදු හද බැඳගත් විරාගත"නිබ්බාන" සංකල්පය බේරා ගැනීමට ගත් අනිසි ප්‍රයත්නයක්**

**අටුවාව දක්වන පරිදි** බුදුරදුන් මේ සූත්‍රය දේශනා කිරීමේ ආසන්න හේතුව පර්‍යාපතිය නිසා මානය උපදවාගත් භික්ෂූන පන්සිය නමකගේ මානය දුරුකිරීමය. ඔවුන්ගේ මානයට විශේෂයෙන් තුඩුදුන් කරුණ හැටියට අටුවාව සඳහන් කරන්නේ ඔවුන් පැවිද්දට පෙර ත්‍රිවේද පරාගත බමුණන්ව සිටීමය**.** "ඉදමවොච භගවා. න තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති" ( භාග්‍යාතුන් වහන්සේ මෙය වදාළහ. ඒ භික්ෂූහු භාග්‍යාතුන් වහන්සේගේ භාෂිතය ගැන සතුටු නොවූහ.)

මේ තරම් දිගු සූත්‍ර දේශනාවක් එය දෙසීමට විශේෂයෙන් අරමුණුවූ භික්ෂූන්ගේ සතුටට හේතු නොවීයයි සඳහන් වන අන් තැනක් නැති තරම් ය. ඒ නිසා අටුවා මතය සහේතුක විය හැකිය. අප ඉහත දැක්වූ පරිදි මේ සූත්‍රය සමස්තයක් වශයෙන් සංකල්පයන්ගේ මෙන්ම ඒවායේ ක්‍රියාකාරක පද සම්බන්ධයේ යථා තත්වය හෙළිදරව් කරයි. සංකල්ප භෞතික හෝ අධ්‍යාත්මික හෝ වේවා, ලෞකික හෝ වේවා, ලෝකෝත්තර හෝ වේවා ආධානග්‍රාහීව දෘෂ්ටිග්‍රාහයෙන් නොගත යුතු ය. ඒවා පරමාර්ථ වශයෙන් නොගතයුතු අතර, අධ්‍යාත්මික ප්‍රයත්නය තුළදීම අවස්ථානුකූලව ඒවා අතහැර දැමිය යුතු වේ. සූත්‍රයේ සැබෑ අර්ථසාරය මෙය නම් එය ඇසූ ඒ මානත්ථද්ධ භික්ෂූන් දුර්මුඛ වීමෙහි පුදුමයක් නැත. අටුවා මතයට අනුව නම් ඔවුන් දුර්මුඛ වූයේ මේ ගැඹුරු සූත්‍ර දේශනාව ඔවුන්ට තේරුම් නොගිය නිසා ය.

එහෙත් ඒ වෙනුවට අපට පෙන්වාදිය හැක්කේ ඔවුන් දුර්මුඛවූයේ සූත්‍රය තේරුම් ගත් නිසාම බව ය. ඔවුන්ගේ මානය දුරුවූයේ (අටුවාව කියන පරිදි ) සූත්‍රයේ ගැඹුරු බව නිසා නොවේ. සූත්‍රය තුළින් ඉස්මතු කෙරෙන භාෂාවේ අන්තර්ලීන අපෝහක බවම ඔවුන්ගේ මානය මර්දනය කළබව කිව හැකිය. ඇත්තෙන්ම මේ සූත්‍ර දේශනාවෙන් කැරෙන “අනාවරණය” අප බොහෝ දෙනෙකුන් නොසන්සුන් කරවන සුලුය. බුදුගොස් හිමියන් පවා මේ සූත්‍ර යටින් දිවෙන අර්ථවායාවන් මුළුමනින්ම අගය කිරීමට පසුබට වූ බව පෙනේ. මෙයට සාධක වන කදිම ඉඟියක් සංකල්ප විසිහතරේ ලේඛනයේ අගට එන “නිබ්බාන” යන වචනය පෙළිබඳව **බුදුගොස් හිමියන් දෙන විවරණය තුළින් මතුවෙයි. මේ විවරණයේ දී උන්වහන්සේ “නිබ්බාන” යන්නෙන් මෙහිදී අදහස් කරන්නේ අන්‍යතීර්ථකයන්ගේ “නිබ්බාන” සංකල්ප පහ පමනක් බව පෙන්වා දීමට සුහුසුළු වෙති**. මෙසේ පටු අර්ථයකින් ගැනීම සූත්‍රයේ ගැඹුරු අන්තර්ගත හා කිසිසේත් නොසැසඳෙන්නකි. **අටුවා සම්ප්‍රදාය, බොදු හද බැඳගත් විරාගත “නිබ්බාන” සංකල්පය බේරා ගැනීමට ගත් අනිසි ප්‍රයත්නයක් ඒ තුළින් ප්‍රකට වේ**. විමුක්ත මුනිවරයා “නිබ්බාන” හෝ “විරාග” වැනි සංකල්ප පවා ග්‍රහණය කර නොගන්නා බව සුත්තනිපාතයේ සුද්ධට්ඨක සූත්‍රයේ ද සඳහන් වේ. https://www.dhammikaweb.com/?p=21526

**පිටක මූලාශ්‍ර සහ ආශ්‍රිත ග්‍රන්ථයන්:**

- **පුඤ්ඤකිරිය වත්ථු සූත්‍රය** - අංගුත්තර නිකාය, අට්ඨක නිපාත, දාන වග්ග
- **කණ්ණකත්ථල සූත්‍රය** - මජ්ඣිම නිකාය » මජ්ඣිම පන්නාසකය » 4. රාජ වර්ගය
- **සඞ්ගාරව සූත්‍රය** – මජ්ඣිම නිකාය » මජ්ඣිම පන්නාසකය » 5. බ්‍රාහ්මණ වර්ගය
- **හෙමක සූත්‍රය**
- **ජටා සූත්‍රය** – සංයුත්තනිකාය-සගාථාවග්ගපාළි-1. දෙවතාසංයුත්තං
- **වණිජ්ජා සූත්‍රය -** උපාසකවග්ගො, පඤ්චකනිපාත -අඞ්ගුත්තරනිකාය
- **මජ්ඣෙසුත්තං** – අඞ්ගුත්තරනිකාය, ඡක්කනිපාතපාළි, 6. මහාවග්ගො
- **මූලපරියාය සූත්‍රය** – 1. මූල පරියාය වර්ගය, මූලපණ්ණාසක, මජ්ඣිම නිකාය
- **සංයුත්ත නිකායේ ලක්ඛන සංයුත්තය**
- Gods in Buddhism – Professor M.M.J. Marasinghe
- **සංකල්ප සහ යථාර්තය -** *පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමි*
- The great betrayal of Theravada Buddhism? – Prof. M. M. J. Marasinghe
- **සතොයාදය -** වල්පොල රාහුල හිමි
- **ලක්දිව බුදුසමයේ ඉතිහාසය -** වල්පොල රාහුල හිමි
- **පටිච්චසමුප්පාද දේශනා** (20) – *පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද හිමි.*
- **මහාවංසය**
- **බුදු දහම දේවාගමක් කිරීම -** මහාචාර්‍ය එම් එම් ජේ මාරසිංහ මහතා
- බුද්ධඝෝෂ හිමියන්ගේ අත්ථසාලිනි අට්ඨ කථාව
- කාලිංග බෝධි ජාතකයට ලියූ අට්ඨ කථාව
- Gods in Buddhism – Professor M.M.J. Marasinghe
- **බුදුදහම සහ බුද්ධාගම**" – මහාචාර්‍ය එම් එම් ජේ මාරසිංහ
- සංයුත්ත නිකායේ ලක්ඛන සංයුත්තය

https://www.dhammikaweb.com/